සැ. යු.- 2014.05.02 දින පළ වූ අංක 1,861 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,862 - 2014 මැයි මස 09 වැනි සිකුරාදා - 2014.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 684 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 684 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි* දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්*, 2014 මැයි මස 30 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2014 මැයි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 ජුනි මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 අප්‍රේල් මස 22 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | අලව්ව | කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුව කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |

05-233

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරි තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරි තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 ජූලි මාසයේදී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේදී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව.*—

(i) සෑම අපේක්ෂකයකුම ඔහු/ඇය :-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවත්,
(ආ) විශිෂ්ට චරිතයකින් යුත් අයකු බවත්,
(ඇ) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 28 ට නොවැඩි බවත්, සතුටුදායක සාක්ෂිවලින් ඔප්පු කළ යුතු ය.

සටහන : යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

(ii) ශාරීරික යෝග්‍යතාවය.—පිරිමි අපේක්ෂකයකුගේ උස අඩි 5 අඟල් 5 කට අඩු නොවිය යුතු අතර, පපුව (ප්‍රසාරණය කළ විට) අඟල් 33 ට නොඅඩු විය යුතු ය.

ගැහැණු අපේක්ෂිකාවන්ගේ උස අඩි 5 යි අඟල් 03 කට නොඅඩු විය යුතු ය.

(iii) අධ්‍යාපන සුදුසුකම්.-සෑම අපේක්ෂකයකුටම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතු ය. :-

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (වෛකල්පිත සාමාර්ථය අදාළ නොවේ.);

හෝ

අ. පො. ස. උසස් පෙළ ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සටහන.—* උපාධියකට අදාළ විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිම අයෙකුට මෙම විභාගයට පෙනී සිටීමට නොහැක. කෙසේ වුවද පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමත් වූ අයෙකුට ඔහු/ඇය එම උපාධි විභාගය සමත් වූ බවට එම විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබා ගත් නිල ලිපියක් ඉදිරිපත් කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට අවසර දිය හැකිය.

03. *සේවා කොන්දේසි* :—

(i) *වැටුප*:— මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.:—

රා. ප. චක්‍රලේඛ අංක : 6/2006 (iv) - 1— MN5-2006A
රු. 16,720 - 320 x 10 - 365 x 11 - 450 x 15 — රු. 30,685

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන් විසින්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතු ය.

(vi) මෙම *ගැසට්* පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය* : බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ. :—

| | | |
|---|---|---|
| (i) | අභියෝග්‍යතා පරීක්ෂණය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (ii) | ඉංග්‍රීසි භාෂාව (පැය 1 1/2 යි) | ලකුණු 100 යි |
| | එකතුව | 200 යි |

*අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය.—* මෙම ප්‍රශ්න පත්‍රයට අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ භාෂා ප්‍රවීණත්වය හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය.—* අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*සටහන.—* මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම (එනම්, සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පෙනී සිටිය යුතු ය. කෙසේ වුව ද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ පෙනී සිට සමත් වූ අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට *නැතහොත්* දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ අධ්‍යාපන ලද අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට තමා කැමති නම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයීමට හැකි වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැළකිය යුතු ය.

(iii) *ඇගයීමේ ක්‍රමය.-* තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ලකුණුවල එකතුවට අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඔවුන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අපේක්ෂකයාගේ සිට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුපාතිකව අපේක්ෂකයින් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10ක් ලබා දෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද යොමු කෙරේ. එහිදී අපේක්ෂකයින්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, සුදුසුකම් පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරුවල සත්‍යතාව වැනි කරුණු මෙහි දී පරීක්ෂා කරනු ලැබේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල.—* කලාප මට්ටමේ ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවැනි ස්ථානයට ලකුණු 2 යි. තුන්වැනි ස්ථානය ලකුණු 1 යි.

දිස්ත්‍රික් මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 4 යි. දෙවැනි ස්ථානයට ලකුණු 3 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 2 යි.

ජාතික මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 5 යි. දෙවැනි ස්ථානයට ලකුණු 4 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 3යි.

කලාප තරගවලදී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 3යි. දෙවැනි ස්ථානයට ලකුණු 2යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 1 බැගින් ලබා දෙනු ලැබේ.

දිස්ත්‍රික් තරගවල දී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 4 යි. දෙවැනි ස්ථානය සඳහා ලකුණු 3යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 2 බැගින් ලබා දෙනු ලැබේ.

ජාතික මට්ටමේ තරගවල දී කණ්ඩායමක සාමාජිකයෙකුහට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයෙකු නම් ලකුණු 5යි. දෙවැනි ස්ථානයට ලකුණු 4යි. තුන්වැනි ස්ථානය සඳහා ලකුණු 3 බැගින් ලබා දෙනු ලැබේ.

05. *තෝරා ගැනීමේ පදනම.*— ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීම් පිරිනැමීම සඳහා තෝරාගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10%කට නොවැඩි ප්‍රමාණයක් අපේක්ෂිකාවන් සඳහා වෙන් කෙරේ.

05. (I) *ප්‍රතිඵල නිකුත් කිරීම.*— ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු හා සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results. exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

*සටහන.*—රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරීන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හි සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල* :

(i) *ආදර්ශ අයදුම්පත* .—මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදි ම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතු ය. අයැදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේ ම සිහි තබා ගත යුතු ය. (ආදර්ශ අයැදුම්පත්‍රයේ 01 සිට 05 තෙක් ශීර්ෂ 1 වැනි පිටුවට ද, 06 සිට 10 තෙක් ශීර්ෂ දෙවැනි පිටුවේ ද, ඉතිරිය තුන්වැනි පිටුවට ද, වන සේ A 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න). ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අයදුම්පත් 2014.06.04 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 750 ක මුදලක් ගෙවා ලබාගත් ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. 2014.06.04 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතු ය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(v) *සහතික කිරීම.*-දැනට රජයේ සේවයේ යෙදී සිටින අයැදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන්, හෝ යුධ හමුදාවක කොමිෂන්ලත් නිලධාරියෙකු, වාර්ෂිකව රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

08. *(i) විභාග ප්‍රවේශ පත්‍ර.*- විභාග අයදුම්පත් ලැබී ඇති සියලුම අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුව වෙත ඒ පිළිබඳව දන්වා සිටිය යුතු ය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) *විභාගයට ඇතුළත් කර ගැනීම* - විභාගයට පෙනී සිටින සෑම අපේක්‍ෂයෙක්ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. එසේ නොකරන අපේක්‍ෂකයෙකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත. මෙම *ගැසට්* පත්‍රයේ පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අපේක්‍ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්‍ෂකයන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

*සටහන* : විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්‍ෂකයකු විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

09. *අනන්‍යතාවය.*—අපේක්ෂකයින් විභාග ශාලව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ. :—

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය;

(*ආ*) මෙම විභාග දිනට අවුරුදු 05කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි* :

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හා අදාළ වේ නම්, ශීර්ෂ අංක 02හි 'සටහන' යටතේ දක්වා ඇති අවශ්‍යතාව සඳහා වූ ලේඛනය හැර සහතිකපත්, ඒවායේ ඡායා පිටපත් හෝ වෙනත් කිසිදු ලිපි ලේඛනයක් නොඑවිය යුතු ය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම, විස්තර අයැදුම්පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයැදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(*අ*) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

*සටහන.*—එම සහතිකය සමාදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වාර්ෂිකව රු. 2,40,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිළි ලෙස සඳහන්ව තිබිය යුතු ය. (රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්‍ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.).

(*ආ*) අපේක්‍ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්‍ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

*සටහන්* : (i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උධෘත භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්‍ෂකයා/ අපේක්‍ෂිකාව සාමාන්‍යයෙන් භාවිත කරන, එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර, වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි).

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් එනම්, අපේක්‍ෂකයා උපාධි විභාගය සමත් බවට විශ්ව විද්‍යාලයක ලේඛකාධිකාරි විසින් නිකුත් කරන ලද නිල ලියවිල්ලක් හා විභාග දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය.

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවලදී දැක් වූ කුසලතා සම්බන්ධ ලේඛන.

(vi) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්‍ෂකයින්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්‍ෂකයකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සෙකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම.*—මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්‍ෂකයකුට, ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුව ද, ඔහුගේ/ඇයගේ අපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකි ය. අපේක්‍ෂකයකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම්

අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
මහ ලේකම් කාර්යාලය,
කොළඹ 01.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014***

Open Competitive Examination for Recruitment to Posts of Assistant Superintendent of Customs, Grade II of Sri Lanka Customs Department - 2014

විභාගයට පෙනී සිටින භාෂා මධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. අයදුම්කරුගේ නම :

1.1 මුල ’කුරු අගට යොදා මුල ’කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා.- SILVA B. A.)

1.2 මුල ’කුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුල ’කුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
සිංහලෙන්/දෙමළෙන් :————.

02. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :

3.1 හැඳුනුම්පත් අංකය :

3.2 නිකුත් කළ දිනය :

04. ස්ත්‍රී/පුරුෂභාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචියෙන් - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. ජනවර්ගය :
සිංහල 1
ලංකා දෙමළ 2
ඉන්දියානු දෙමළ 3
මුස්ලිම් 4
බර්ගර් 5 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
වෙනත් 6

07. උපන් දිනය :

(අ) අවුරුද්ද : මාසය : දිනය :

(ආ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

08. ශාරීරික යෝග්‍යතාවය :
(i) උස : අඩි ………… අඟල් …………

(ii) පපුව (ප්‍රසාරණය කළවිට) : අඟල් …………
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි.)

09. ඔබ කවදා හෝ උසාවියකින් වැරදිකරුවකු වී තිබේද? ඔව්/නැත
"ඔව්" නම් විස්තර සඳහන් කරන්න. :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

| *විශ්වවිද්‍යාලයේ නම* | *උපාධිය* | *උපාධියේ පංතිය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(i) අ. පො. ස. (සා. පෙළ.) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති ඉහළම සාමාර්ථ්‍යය : [ ]

වර්ෂය :————.

විභාග අංකය :————.

(ii) අ. පො. ස. (උ. පෙළ.) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති ඉහළම සාමාර්ථ්‍යය : [ ]

වර්ෂය :————.

විභාග අංකය :————.

11. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතුය)

(i) ගෙවන ලද දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.

(iv) ලදුපතේ අංකය :————.

(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතුය)

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

12. අයදුම්කරුගේ ප්‍රකාශය/සහතිකය ඃ

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න).

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................ නමැති මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............................ මස ............... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

දිනය :————.

සටහන : අයදුම්පත සහතික කළ යුත්තේ ගැසට් නිවේදනයේ 7 (V) ඡේදයේ සඳහන් පරිදිය.

14. *ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................ මහතා/ මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කල හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව)

දිනය :————.

ආයතන ප්‍රධානියාගේ නම :————.

තනතුර :————.

සේවා ස්ථානයේ ලිපිනය :————.

05-237/1

---

## ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 ජූලි මාසයේදී දිවයින පුරා පිහිටි පහත දැක්වෙන ප්‍රධාන නගර වලදී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේදී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සතුවේ.

විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර හා නගර අංක —

| *පළාත* | *නගරය* | *නගර අංක* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |

| පළාත | නගරය | නගර අංක |
|---|---|---|
| උතුරු (සම්බන්ධිතයි) | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරු මැද | අනුරාධපුරය | 20 |
| | පොලොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොණරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් අයදුම්කරුගේ දෙවන තේරීම අනුව සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත එම අයදුම්කරුවන් යොමු කරනු ලැබේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. යෝග්‍යතාව -

(i) සෑම අපේක්ෂකයෙකුම ඔහු/ඇය

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බවත්,

(ආ) විශිෂ්ට චරිතයකින් යුත් අයකු බවත්,

(ඇ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 24 ට නොවැඩි බවත්, සතුටුදායක සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය.

සටහන : යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

(ii) ශාරීරික යෝග්‍යතාවය - පිරිමි අපේක්ෂකයෙකුගේ උස අඩි 05 අඟල් 05 ට නොඅඩු විය යුතු අතර, (ප්‍රසාරණය කළ විට) පපුව අඟල් 33 ට නොඅඩු විය යුතුය.

කාන්තා අපේක්ෂිකාවන් උස අඩි 05 යි අඟල් 03ට නොඅඩු විය යුතුය.

(iii) අධ්‍යාපන සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය. :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් තුනකින් එකවර සමත්වීම.;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයන් වශයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව සම්මාන සාමාර්ථයන් පහක්ද, ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සමත් විය යුතුය.

03 සේවා කොන්දේසි :

(i) වැටුප : මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.
රා/ප/චලේ අංක : 6/2006 (iv) - R-S-1-2006
රු. 14,280 - 145 x 7 - 180 x 10 - 240 x 17 - රු. 21,175

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදු විය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතුය.

(vi) මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටස (iiඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි වලට ද අවධානය යොමු කෙරේ.

04. විභාග පරිපාටිය : බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ :-

| | | |
|---|---|---|
| (i) | අභියෝග්‍යතා පරීක්ෂණය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (ii) | ගණිතය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (iii) | ඉංග්‍රීසි භාෂාව (පැය 01 1/2යි) | ලකුණු 100 යි |
| | එකතුව | ලකුණු 300 යි |

අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ භාෂා ප්‍රවීණත්වය, හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ගණිතය ප්‍රශ්න පත්‍රය : අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ ගණිත හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය : අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ, ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

සටහන : මෙම විභාගය සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම (එනම්, සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පෙනී සිටිය යුතුය. කෙසේ වුවද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින ලද අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට තමා කැමති නම් මෙම විභාගයේදී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය හැකි වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අපේක්ෂකයන්ට/ අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) අගැයීමේ ක්‍රමය : තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව ලකුණු ලබා ගන්නා වැඩිම ප්‍රමාණයේ සිට පහළට එමින් පවත්නා පුරප්පාඩු අනුව අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී, ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10ක් ලබාදෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට යොමු කෙරේ. එහිදී අපේක්ෂකයින්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, විභාගයේ දී ලබාගත් ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේ දී ලබාගත් ලකුණු පමණක් සැළකිල්ලට ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල : කලාප මට්ටමේ ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවැනි ස්ථානයට ලකුණු 2 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 1 යි

දිස්ත්‍රික් මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 4 යි. දෙවැනි ස්ථානයට ලකුණු 3 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 2යි.

ජාතික මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 5 යි. දෙවැනි ස්ථානයට ලකුණු 4 යි. තුන්වැනි ස්ථානයට ලකුණු 3 යි.

05 *තෝරා ගැනීමේ පදනම.*—ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීම් පිරිනැමීම සඳහා තෝරාගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10% කට නොවැඩි ප්‍රමාණයක් අපේක්ෂිකාවන් සඳහා වෙන් කෙරේ.

05. (i) *ප්‍රතිඵල නිකුත් කිරීම.*-ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු හා සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

සටහන.—රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරීන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හි සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල :*

(i) *ආදර්ශ අයැදුම්පත.*—මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. අයැදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයැදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතු ය. අයැදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයැදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතු ය. අයැදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතු ය. (ආදර්ශ අයැදුම්පත්‍රයේ 01 සිට 05 තෙක් ශීර්ෂ පළමු වැනි පිටුවට ද, 06 සිට 11 තෙක් ශීර්ෂ දෙවැනි පිටුවේ ද ඉතිරිය තුන්වැනි පිටුවටද, වනසේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න) ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(ii) අයැදුම්පත් 2014.06.04 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එම දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයැදුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය. (සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග ගාස්තු වශයෙන් රුපියල් 500ක මුදල් ගෙවා ලබාගත් ලදුපතක් අයැදුම් පත්‍රයට අමුණා එවිය යුතු ය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයැදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් තමන්ගේ අයැදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. 2014.06.04 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයැදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයැදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයැදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයැදුම්පත් වුව ද නියමිත දිනට පසුව ලැබුනහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයැදුම්කරුවන්ගේ අයැදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයැදුම්පත් ප්‍රතික්ෂේප වන ඇත."

(v) *සහතික කිරීම.*- දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයැදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනිකුත් අයැදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයකු, නොතාරිස් නිලධාරියකු, රජයේ හෝ අධ්‍යක්‍ෂ පාලිත පාසලක විදුහල්පතිවරයෙකු, නාවික,

ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියෙකු වාර්ෂිකව රුපියල් 240,360ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතුය.

08. *(i) විභාග ප්‍රවේශ පත්‍ර.*- විභාග අයදුම්පත් ලැබී ඇති සියළුම අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ පිළිබඳව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම් කරුවෙකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක්ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) *විභාගයට ඇතුළත් කර ගැනීම* - විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂයෙක්ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කවරාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අපේක්ෂයෙකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි (කොටස) (IIඅ) ඡේදයෙහි විභාග අපේක්ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්ෂකයන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

*සටහන.*—විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්ෂකයකු විභාගයට පෙනී සිටීම සඳහා සියළු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

09. *අනන්‍යතාව.*—අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(*ආ*) මෙම විභාග දිනට අවුරුදු 05 ක වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. සුදුසුකම් පිළිබඳ ලියවිලි :

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හැර වෙනත් කිසිදු ලිපිලේඛනයක් නොඑවිය යුතුය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාවය ඔප්පු කළ යුතුය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

සටහන : එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වාර්ෂිකව රු. 240,.360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරෙකුගෙන් වුවද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එය පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතුය.

රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

සටහන් :

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උධෘත භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා/ අපේක්ෂිකාව සාමාන්‍යයෙන් භාවිත කරන, එසේම ඔහු/ඇය විභාගයේදී පෙනී සිටින නම/නම් හා අතර, වෙනසක් වේනම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක : 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචිවීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි),

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත්කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක්,

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවල දී දැක් වූ කුසලතා සම්බන්ධ ලේඛන,

(vi) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි

ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

11. සාවද්‍ය තොරතුරු සැපයීම.- මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට, ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීම නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයැදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ නියමය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පලවන නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක . 40,
කෙළින්වීදිය,
කොළඹ 11.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014

Open Competitive Examination for Recruitment to Posts of Inspector of Customs, Grade II of Sri Lanka Customs Department - 2014

විභාගයට පෙනි සිටින භාෂා මාධ්‍යය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ -3
ඉංග්‍රීසි - 4

| නගර තේරීම | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

01. අයදුම්කරුගේ නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :-SILVA B. A.)

1.2 මුලකුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
සිංහලෙන්/දෙමළෙන්

02. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :

3.1 හැඳුනුම්පත් අංකය :

3.2 නිකුත් කළ දිනය :

04. ස්ත්‍රී/පුරුෂ භාවය
පුරුෂ -0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචි වීමෙන් -2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. ජනවර්ගය
සිංහල -1
ලංකා දෙමළ -2
ඉන්දියානු දෙමළ -3
මුස්ලිම් -4
බර්ගර් - 5
වෙනත් - 6

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. උපන් දිනය :

(අ) අවුරුද්ද මාසය දිනය

(ආ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

08. ශාරීරික යෝග්‍යතාව :

(i) උස : අඩි :————. අඟල් :————.

(ii) පපුව (ප්‍රසාරණය කළ විට) : අඟල් :————.
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි)

09. ඔබ කවදා හෝ උසාවියකින් වැරදිකරුවෙකු වී තිබේද? ඔව්/නැත

'ඔව්' නම් විස්තර සඳහන් කරන්න. :————.

10. අධ්‍යාපන සුදුසුකම් ඃ
(i) අ. පො. ස. (උසස් පෙළ) පළමුවන වර -

විභාග වර්ෂය

විභාග අංකය

| *විෂයයන්* | *සාමාර්ථ්‍යය* | *විෂයයන්* | *සාමාර්ථ්‍යය* |
|---|---|---|---|
| | | | |

(ii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| *විෂයයන්* | *සාමාර්ථ්‍යය* | *සමත් වූ වර්ෂය* | *විභාග අංකය* | *විෂයයන්* | *සාමාර්ථ්‍යය* | *සමත් වූ වර්ෂය* | *විභාග අංකය* |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

(iii) අ. පො. ස. (සා. පෙළ.) ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා ඇත්ද? ඔව්/නැත.

11. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතුය) ඃ

(i) ගෙවන ලද දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.

(iv) ලදුපතේ අංකය :————.

ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතුය)

12. *අයැදුම්කරුගේ ප්‍රකාශය/සහතිකය* ඃ

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* (අදාළ නොවන වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................. නැමැති මහතා/මහත්මිය/මෙනෙවිය හා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය ........... මස ........... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

*සටහන* ඃ *අයදුම්පත සහතික කළ යුත්තේ ගැසට් නිවේදනයේ 7 (v) ඡේදයේ සඳහන් පරිදිය.*

14. *ආයතන ප්‍රධානියාගේ නිර්දේශය* ඃ

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන .................................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව).

දිනය :————.
ආයතන ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
සේවා ස්ථානයේ ලිපිනය :————.

05-237/2

## ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ III වන ශ්‍රේණියේ රේගු නියාමක තනතුරුවලට ආධුනිකයින් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2014

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ III වන ශ්‍රේණියේ රේගු නියාමක තනතුරුවලට ආධුනිකයින් බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 ජූලි මාසයේදී දිවයින පුරා පිහිටි පහත දැක්වෙන ප්‍රධාන නගර වලදී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේදී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සතුවේ.

විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර හා නගර අංක

| *පළාත* | *නගරය* | *නගර අංක* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරු මැද | අනුරාධපුරය | 20 |
| | පොලොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොණරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් අයදුම්කරුගේ දෙවන තේරීම අනුව සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත එම අයදුම්කරුවන් යොමු කරනු ලැබේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාව* -

(i) සෑම අපේක්ෂකයෙකුම ඔහු/ඇය

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බවත්,

(ආ) විශිෂ්ට චරිතයකින් යුත් අයකු බවත්,

(ඇ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි බවත්, සතුටුදායක සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය.

*සටහන* : යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

(ii) *ශාරීරික යෝග්‍යතාවය.*—පිරිමි අපේක්ෂකයෙකුගේ උස අඩි 05 අඟල් 05 ට නොඅඩු විය යුතු අතර, (ප්‍රසාරණය කළ විට) පපුව අඟල් 33 ට නොඅඩු විය යුතුය.
කාන්තා අපේක්ෂිකාවන් උස අඩි 05 යි අඟල් 03ට නොඅඩු විය යුතුය.

(iii) *අධ්‍යාපන සුදුසුකම්* - සෑම අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව ගණිතය සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයන් සහිතව ප්‍රධාන විෂයන් 06 කින් එකවර සමත් වීම.

03 *සේවා කොන්දේසි* :

III වන ශ්‍රේණියේ රේගු නියාමකවරුන් ලෙස බඳවා ගැනීමට සලකා බැලීම සඳහා කැඳවනු ලැබූ පසු එළඹෙන 06 මාසය තුළදී රේගු අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරන ලද ස්ථානයක දී ආධුනිකයින් වශයෙන් පුහුණුව ලැබිය යුතුය. එම කාලය තුළ වැටුප් නොගෙවන අතර, පුහුණුවීමේ මාසික දීමනාවක් පමණක් ගෙවනු ලබයි. එකී කාලසීමාව අවසානයේදී පවත්වනු ලබන ගිනි අවි පරිහරණය පිළිබඳ පුහුණුව හා ආත්මාරක්ෂක සටන් ක්‍රම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයේදී අවශ්‍ය පරිසාධන මට්ටම ළඟා කර ගන්නා ආධුනිකයින් පමණක් රේගු සේවයෙහි ස්ථිර තනතුරකට බඳවා ගනු ලැබේ. එකී පරිසාධන මට්ටම ළඟා කර ගැනීමට අපොහොසත් ආධුනිකයින්ගේ සේවය අවසන් කරනු ලබයි.

(i) *වැටුප* : මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ. :
රා/ප/චලේ අංක : 6/2006 (iv) - P-L-2-2006-A
රු. 12,210 - 130 x 10 - 145 x 10 - 160 x 10- 170 x 12 -රු. 18,600

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේදීම සේවය කිරීමට සිදු විය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතුය.

(vi) මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි වලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය :* බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ. :

| | | |
|---|---|---|
| (01) | අභියෝග්‍යතා පරීක්ෂණය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (02) | ගණිතය (පැය 01 1/2 යි) | ලකුණු 100 යි |
| | එකතුව | ලකුණු 200 යි |

*අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය :* මෙම ප්‍රශ්න පත්‍රයට අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන්ගේ භාෂා ප්‍රවීණත්වය, හා තර්කන ශක්තිය මැනීම සඳහා ප්‍රශ්න ඇතුළත් වේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*ගණිතය ප්‍රශ්න පත්‍රය :* අපේක්ෂකයින්ගේ/අපේක්ෂිකාවන්ගේ ගණිත හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*සටහන :* මෙම විභාගය සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02 (iii) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම (එනම්, සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පෙනී සිටිය යුතුය. කෙසේ වුව ද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින ලද අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට තමා කැමති නම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය හැකි වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් විභාගයට නුසුදුස්සන් කරනු ලැබීමට ද ඉඩ ඇත.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අපේක්ෂකයන්ට/ අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) *ඇගයීමේ ක්‍රමය :* තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 50% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව ලකුණු ලබා ගන්නා වැඩිම ප්‍රමාණයේ සිට පහළට එමින් පවත්නා පුරප්පාඩු අනුව අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහි දී, ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10 ක් ලබා දෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට යොමු කෙරේ. එහි දී අපේක්ෂකයින්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල :*
කලාප මට්ටමේ ක්‍රීඩා තරඟ ප්‍රථම ස්ථානයට ලකුණු 3 යි. දෙවන ස්ථානයට ලකුණු 2 යි. තුන්වන ස්ථානයට ලකුණු 1 යි

දිස්ත්‍රික් මට්ටමේදී ප්‍රථම ස්ථානයට ලකුණු 4 යි. දෙවන ස්ථානයට ලකුණු 3 යි. තුන්වන ස්ථානයට ලකුණු 2යි.

ජාතික මට්ටමේ දී පළමුවන ස්ථානයට ලකුණු 5 යි. දෙවන ස්ථානයට ලකුණු 4 යි. තුන්වන ස්ථානයට ලකුණු 3 යි.

05. *තෝරා ගැනීමේ පදනම* - ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ආධුනික පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, අනුමත නිලධාරි සංඛ්‍යාවෙන් 10% ක් කාන්තා නිලධාරින් සඳහා වෙන් කෙරේ.

05. (i) *ප්‍රතිඵල නිකුත් කිරීම.*-ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂයන්ගේ ලිඛිත විභාග ලකුණු හා සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටින සියළුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

*සටහන :* රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරින්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හි සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. ඉල්ලුම් කිරීමේ පිළිවෙල :

(i) ආදර්ශ අයැදුම්පත - මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. අයැදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයැදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙල කළ යුතු අතර, එම තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයැදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයැදුම්කරු විසින් පිරිවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතුය. අයැදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතුය. (ආදර්ශ අයැදුම්පත්‍රයේ 01 සිට 05 තෙක් ශීර්ෂ 1 වන පිටුවට ද, 06 සිට 11 තෙක් දෙවන පිටුවේ ද ඉතිරිය තුන්වන පිටුවට ද, වනසේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න) ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.)

(ii) අයැදුම්පත් 2014.06.04 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයැදුම්පත්‍රය බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය)

අයැදුම්පත් යොමුකළ යුතු ලිපිනය :

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ

(iii) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයින් තමන්ගේ අයැදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. 2014.06.04 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයැදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයැදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට අයැදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයැදුම්පත් වුවද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයැදුම්කරුවන්ගේ අයැදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයැදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(iv) *විභාග ගාස්තු* - විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක : 2003-02-13 යටතේ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග ගාස්තු වශයෙන් රුපියල් 400 ක මුදල් ගෙවා ලබාගත් ලදුපතක් අයැදුම් පත්‍රයට අමුණා එවිය යුතුය. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයැදුම්කරුවන් විසින් තමන් ළඟ තබාගැනීම ඉතා යෝග්‍යය වේ. මෙම විභාග ගාස්තු- කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

(v) *අත්සන සහතික කිරීම*.- දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයැදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනිකුත් අයැදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන්ලත් නිලධාරියකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු යන අයගෙන් කෙනෙකු විසිනි.

08. *විභාගයට ඇතුළත් කර ගැනීම*.- විභාග කොමසාරිස් ජනරාල් වෙත යොමු කරනු ලැබූ අයැදුම්පත් වෙනුවෙන් ඒ ඒ අපේක්ෂකයින් වෙත ප්‍රවේශ පත්‍ර යවනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කර ගත යුතු අතර එසේ තමන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එබඳු ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් තමන්ට නියම කර තිබෙන විභාග ශාලාවෙහි ම විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියම කර ඇති විභාග ශාලාව හැර වෙනත් විභාග ශාලාවකට පැමිණෙන කිසිම අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකු විසින්ම තමන් විභාගයට පෙනී සිටින පළමු දිනයෙහිම ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටස (IIඅ) ඡේදයෙහි විභාග අපේක්ෂකයින් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අපේක්ෂකයින් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර ඇතුළත් ලිපියක, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කොට එය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් විමසා සිටීමද සුදුසු වේ. එහිදී අවශ්‍ය තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබා ගත් අයැදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

09. *අනන්‍යතාව* : අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ආ) මෙම විභාග දිනට අවුරුදු 05 ක වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයැදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. *සුදුසුකම් පිළිබඳ ලියවිලි* :

(i) අයැදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හැර වෙනත් කිසිදු ලිපිලේඛනයක් නොඑවිය යුතුය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම, විස්තර අයැදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයැදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් ලියකියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතුය.

(iii) පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

සටහන : එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥවරයෙක්, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ රු. 240,360 ක ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරෙකුගෙන් වුවද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනයද එය පැහැදිළි ලෙස සඳහන්ව තිබිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(අ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

සටහන් :

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උඩෘත භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා/ අපේක්ෂිකාව සාමාන්‍යයෙන් භාවිත කරන, එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර, වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක : 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි).

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත්කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක්,

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවලදී දැක්වූ කුසලතා සම්බන්ධ ලේඛන.

(vi) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු මෙම ආධුනික තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම*.- මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට, ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවකදී වුවද, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත්, හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීම නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමත පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක . 40,
කෙළින් වීදිය,
කොළඹ 11.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ III වන ශ්‍රේණියේ රේගු නියාමක තනතුරුවලට ආධුනිකයින් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014

Open Competitive Examination for Recruitment to Posts of Customs Guard, Grade III of Sri Lanka Customs Department - 2014

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ -3
ඉංග්‍රීසි - 4

| නගර තේරීම | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

01. අයදුම්කරුගේ නම :
1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :-GUNAWARDHANA, M. G. B. S. K)

1.2 මුලකුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
සිංහලෙන්/දෙමළෙන් :————.

02. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර :

3.1 හැඳුනුම්පත් අංකය :

3.2 නිකුත් කළ දිනය :

04. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ :
පරම්පරාවෙන් - 1
ලියාපදිංචිවීමෙන් - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. ජන වර්ගය :
සිංහල - 1
ලංකා දෙමළ - 2

ඉන්දියානු දෙමළ -3
මුස්ලිම් -4
බර්ගර් - 5
වෙනත් - 6

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. උපන් දිනය :

(අ) අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

08. ශාරීරික යෝග්‍යතාව

(i) උස : අඩි :————. අඟල් :————.

(ii) පපුව (ප්‍රසාරණය කළ විට) : අඟල් :————.
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි)

09. ඔබ කවදා හෝ උසාවියකින් වරුදිකරුවකු වී තිබේද? ඔව්/නැත

ඔව් නම් විස්තර සඳහන් කරන්න

10. අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස. (සාමාන්‍ය පෙළ) එකවර
විභාග වර්ෂය :————.
විභාග අංකය :————.

| අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

11. විභාග ගාස්තුව

(i) ගෙවන ලද දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :
(ii) ගෙවූ මුදල : (ii). ගෙවූ දිනය :
(iv) ලදුපත් අංකය

ලදුපත එහි දාරයකින් මෙහි අලවන්න. (ලදු පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළ යුතුය.)

12. අයදුම්කරුගේ ප්‍රකාශය/සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................ මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය ........... මස ........... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

සටහන : අයදුම්පත සහතික කළ යුත්තේ ගැසට් නිවේදනයේ 7 (v) ඡේදයේ සඳහන් පරිදිය.

14. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි ය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව).

දිනය :————.
නම :————.
තනතුර :————.
සේවා ස්ථානයේ ලිපිනය :————.

05-237/3

**යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය — කටුනායක**

***ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2014 කණ්ඩායම***

කටුනායක ඉංජිනේරු තාක්‍ෂණ ආයතනයේ ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, 2014 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයැදුම්කරුවන්ට අයැදුම්පත් ඉදිරිපත් කළ හැක.

1.1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විද්‍යාව, ගණිතය සහ භාෂාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) යන විෂයයන් තුන (03) සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;

*සහ*

1.1.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී, ඉංග්‍රීසි විෂයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

1.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත් වීම.

*හෝ*

1.3 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තොරතුරු තාක්‍ෂණය යන විෂයයන් තුන (03) එකවර සමත්වීම.

2. *වයස.-* 2014.12.31 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 25ට නොවැඩි විය යුතුය.

3. පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩසටහන් විස්තර :

මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. මාස 18ක න්‍යායික උපදෙස් පාඨමාලාව, මාස 30ක ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත.

| | |
|---|---|
| මූලික න්‍යායික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්‍ෂණ (ඉ. තා.) ආයතනයේදී | - මාස 06 |
| මූලික කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතනවල දී | - මාස 12 |
| සාමාන්‍ය න්‍යායික උපදෙස් වැඩසටහන ඉ. තා. ආයතනයේ දී | - මාස 06 |
| සාමාන්‍ය කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතනවල දී | - මාස 12 |
| විශේෂ න්‍යායික උපදෙස් වැඩසටහන ඉ. තා. ආයතනයේ දී | - මාස 06 |
| විශේෂ කර්මාන්ත පුහුණුව බාහිර පුහුණු ආයතනවල දී | - මාස 06 |

මෙම ඉංජිනේරු පාඨමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේ දී ලබා දෙන අතර, කර්මාන්ත පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත. පාඨමාලාව ආරම්භයේ දී ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වනු ලබන අතර, එයට සියලුම ආධුනිකයින්ගේ සහභාගිත්වය අනිවාර්යය වේ.

4. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ. :-

(අ) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය :

1. සිවිල් - ගොඩනැගිලි හා ව්‍යුහ ඉංජිනේරු පාඨමාලාව
2. සිවිල් - මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. සිවිල් - ජල සහ පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

(ආ) විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය :

4. විදුලි - විද්‍යුත් ඉංජිනේරු පාඨමාලාව
5. විදුලි - විදුලිබල ඉංජිනේරු පාඨමාලාව
6. විදුලි - විදුලි සංදේශ ඉංජිනේරු පාඨමාලාව

(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය :

7. යාන්ත්‍රික - ස්වයංචලන ඉංජිනේරු පාඨමාලාව
8. යාන්ත්‍රික - යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු පාඨමාලාව
9. යාන්ත්‍රික - නාවික ඉංජිනේරු පාඨමාලාව

(i) ඉංජිනේරු තාක්‍ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව ISO 9001 - 2008 තත්ව කළමනාකරණ පද්ධති දක්වා ඇති අවශ්‍යතා පරිදි පැවැත්වේ.

(ii) නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ STCW-95 සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. *පාඨමාලා මාධ්‍ය.* - මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.

6. *ආධුනිකත්ව ගිවිසුම :-*

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා, සහ පුහුණු වන ආයතනය යන දෙදෙනා වෙත අන්‍යෝන්‍ය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුල් විය යුතු අතර, පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී පාඨමාලාව සාර්ථකව අවසන් කරන විට නැවත ආපසු ගෙවනු ලබන රු. 5,000 ක තැන්පතු මුදලක් ලබා දිය යුතුය. ලියාපදිංචියෙන් සති දෙකක් ඇතුලත පාඨමාලාවෙන් ඉවත් වන සිසුනට පමණක් මෙම මුදල නැවත ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකිය.

6.2 රජයේ ලබා දෙන සමෘද්ධි සහනාධාර හිමි පවුලක සාමාජිකයකු නම් ඊට අදාළ මුල් පිටපත් (සමෘද්ධි කාඩ්පත හා ග්‍රාම සේවක නිලධාරි විසින් නිකුත් කරන ලද ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ලිපිය) ඉදිරිපත් කිරීමෙන් ඉහත තැන්පත් මුදලින් නිදහස් විය හැක.

6.3 තෝරාගනු ලබන සෑම ආධුනිකයකුම පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී, පුස්තකාල සංවර්ධන අරමුදල සඳහා නැවත නොගෙවනු ලබන රු. 1,000 මුදලක් ආයතනය වෙත ගෙවිය

යුතු ය. සමෘද්ධි සහනාධාර හිමි පවුල්වල සාමාජිකයන් මෙයින් නිදහස් කරනු ලැබේ.

6.4 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.5 මෙම පාඨමාලා සඳහා ලියාපදිංචිවන සියලුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළ දී පැමිණීමේ ප්‍රතිශතය, ආයතනය මගින් නිකුත් කර ඇති සීමාවන්ට යටත්ව තබා ගත යුතු අතර එසේ නොවන අවස්ථාවල දී අදාළ විභාගවලට පෙනී සිටිය නොහැකි අතර පාඨමාලාවෙන් ඉවත් විය යුතු වේ.

7. *සහතික ප්‍රදානය :*

සාර්ථක ලෙස න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින් හට ආයතනයට ඇති සියලුම බැඳීම්වලින් නිදහස් වූ පසු ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8. *තෝරාගැනීමේ ක්‍රමය :*

8.1 ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් ඇතුළත් කරගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ඡේදයෙහි සඳහන් වයස සීමාව තුළ වූ අයදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

8.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය - සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් වෙත කල්වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ.)

8.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සහ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ද පදනම් කරගෙන පාඨමාලාව සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.4 නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරාගනු ලැබූ අයදුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

9. *අයදුම්පත් :-*

9.1 ඔබගේ අයදුම්පත් සමග අ. පො. ස. (සා. පෙළ) සහ අ. පො. ස. (උ. පෙළ) අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත බැගින් එවීම අනිවාර්ය වේ. එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 සෑම අයදුම්කරුවකු විසින්ම තම අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී නැවත නොගෙවන රු. 500 ක (වෙබ් අඩවියෙන් ලබා ගන්නා අයදුම්පත් සඳහා රු. 700 ක) මුදලක් විභාග ගාස්තු ලෙස (9.3 ප්‍රකාර) ගෙවිය යුතු ය. මෙම මුදල දිවයිනේ පිහිටි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවිය හැකිය.

9.3 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.

(i) ශාඛා අංකය සහ ගිණුම් අංකය - 276-1-001-8-6351396.
(ii) බැර උපදෙස් - මහජන බැංකුව, කටුනායක, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 276-1-001-8-6351396 ට බැර පිණිස.
(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය

9.4 අයදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

9.5 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු. 200ක් ගෙවීමෙන් හෝ තැපෑලෙන් අවශ්‍ය නම් රු. 200ක් වටිනා මුදල් ඇණවුමක් සහ අදාල වටිනාකම සහිත මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරී, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවීමෙන් 2014 ජුනි 20 වැනි දින දක්වා අයදුම්පත් ලබාගත හැක. මුදල් ඇණවුම ගණකාධිකාරී, ඉංජිනේරු තාක්ෂණ ආයතනය නමින් ලබාගත යුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය "කටුනායක" විය යුතු ය. (දුරකථන අංකය : 011-2252833:011-2252834)

9.6 අයදුම්පත වෙබ් අඩවියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් විභාග ගාස්තු ලෙස රු. 700 ක් ගෙවිය යුතුවේ.

9.7 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත, අයදුම්පතේ අලවා 2014 ජුනි 20 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතු ය. කවරයේ වම්පස කෙළවරේ "විශේෂ ආධුනිකයන් බඳවා ගැනීම - 2014" ලෙස සටහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

9.8 රජයේ කාර්මික ආයතනයක හෝ විශ්වවිද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය, හැදෑරූ හෝ හදාරමින් සිටින අයට මේ සඳහා අයදුම් කළ නොහැක.

9.9 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

9.10 මෙයට අමතරව පහත දැක්වෙන කාර්යාලවලට පැමිණ රු. 200ක් ගෙවීමෙන් ද 2014 ජුනි 20 වැනි දින දක්වා අයදුම්පත් මිලදී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
දුරකථන අංක : 011-2888782-7
(ii) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව. දුරකථන අංක : 011-2647393, 011-2643847
(iii) මෝටර්රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 07, ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
දුරකථන අංක : 011-2572977, 011-2532182
(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 10/4 මල්වත්ත පාර, බදුලුපිටිය, බදුල්ල.
දුරකථන අංක : 055-2230644
(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර
දුරකථන අංක : 045-2228667
(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 27ඒ, විවෘත විශ්ව විද්‍යාල මාවත, නූපේ. මාතර
දුරකථන අංක : 041-2226958
(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 108/2බී, තිවංක බෝධි මාවත, මහනුවර.
දුරකථන අංක : 081-2201918

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ගුවන්තොටුපල පාර, අනුරාධපුරය.
දුරකථන අංක : 025-2223178

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.
දුරකථන අංක : 037-2223789

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, සෝමසුන්දරම් පාර, චුන්ඩිකුලි, යාපනය
දුරකථන අංක : 021-2222383

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 06, ග්‍රාමසේවක පටුමග, කල්මුනේ කුඩි 13, කල්මුනේ.
දුරකථන අංක : 067-2229357

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 05
දුරකථන අංක : 011-2597671, 011-2587258

(xiii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 326/2, ප්‍රධාන වීදිය, කළුතර, දකුණ
දුරකථන අංක : 034-2224239

(xiv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 61/5, මීනුවන්ගොඩ පාර, ගම්පහ
දුරකථන අංක : 033-2232874

(xv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මැදගම පාර, මෝලවත්ත, මාදම්පෙ.
දුරකථන අංක : 032-2248250

(xvi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක A/6 මහවැලි නිල නිවාසය, නව නගරය, පොළොන්නරුව.
දුරකථන අංක : 027-3223023

(xvii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, කච්චේරිය සංකීර්ණය, මොණරාගල.
දුරකථන අංක : 055-2276504

(xviii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 77/3, රෝහල් පටුමග, නුවරඑළිය.
දුරකථන අංක : 055-2223702

(xix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 11, පන්සල පාර, මණ්දන්ඩාවල, මාතලේ.
දුරකථන අංක : 066-2223173

(xx) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 440, නුවර පාර, මීපිටිය, කෑගල්ල.
දුරකථන අංක : 035-2223127

(xxi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 395, වක්වැල්ල පාර, ජූල් ගහ, ගාල්ල.
දුරකථන අංක : 091-2235628

(xxii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 34, මිහිඳු මාවත, තංගල්ල.
දුරකථන අංක : 047-2241512

(xxiii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මාන්කුලම් පාර, මුල්ලියාවලයි, මුලතිව්.
දුරකථන අංක : 021-2061012

(xxiv) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, නුවර පාර, ආනන්දපුරම්, කිලිනොච්චිය.
දුරකථන අංක : 034-3942824

(xxv) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 58, අරුනගිරි පාර, ත්‍රිකුණාමලය.
දුරකථන අංක : 026-2226569

(xxvi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 16/1 නව කල්මුනෙයි පාර, මඩකලපුව.
දුරකථන අංක : 065-2228130

(xxvii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 49/21, පළවෙනි පටුමග, කෝවිල පාර, කුරුමන්කඩු, වවුනියාව. දුරකථන අංක : 024-2224679.

(xxviii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 952/1, පරණ මූර් වීදිය, නල්ලයාර් වීදිය, මන්නාරම.
දුරකථන අංක : 023-2223404

10. තැපෑලේදී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.

05-72